# මට හරියට වැඩ

## අපි හැමෝටම කරන්න වැඩක් තියනවා...



**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**

2 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

# මට හරියට වැඩ

අපි හැමෝටම කරන්න වැඩක් තියනවා...



**පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර**
2 ශ්‍රේණිය A
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර

කෘතියේ නම : මට හරියට වැඩ

ප්‍රථම මුද්‍රණය : 2025.01.24

කතාව සහ චිත්‍ර : පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර

කතෘගේ ලිපිනය : අංක: 46/2, පිළවල, ගුන්නෑපාන.

පාසල : මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ශ්‍රේණිය : 2 ශ්‍රේණිය A

ISBN අංකය : ISBN 978-624-208-483-1

පරිගණක අක්ෂර, පිටු සැකසුම

: සංඛ පද්ම බණ්ඩාර

කතෘගේ අනෙකුත් කෘති

- කිටියාට පාඩමක්...
- මම ආසයි ඉගෙනගන්න...
- පාට පාට පාට ලෝකේ...
- Rainbow Fairy
- බඩේ අමාරුව
- අළු කෑදැත්තා නිරීක්ෂණය
- කවුද හොරා?
- මම තනියෙන්
- හරි වැඩේ...

# පිදුම

පෙර පාසලේ ගුරුතුමියන්ට

මගේ පාසලේ ඇදුරුතුමියන්ට

මගේ පාසලේ සොහොයුරියන්ට

මගේ අම්මාට, අප්පච්චීට, මල්ලීට, අත්තාට,

සහ

අත්තම්මාට

බැතියෙන් පුදමි.

# හැඳින්වීම

මෙම පොත "හෙරණගත්කරණී 2024" ව්‍යාපෘතිය යටතේ මහාමායා බාලිකා විද්‍යාලයේ 2 ශ්‍රේණිය ඒ පංතියේ පමෝධ්‍යා ධනංජනී බණ්ඩාර ශිෂ්‍යාව විසින් නිර්මාණය කළ කතාවක් හා චිත්‍ර ඇතුළත් පොතකි.

# ස්තුතිය

පොත් ලිවීමට මහගු අවස්ථාවක් හා පරිසරයක්

තනා දුන්

මගේ පංතිභාර ගුරුතුමිය වන දමයන්ති රත්නායක ගුරු මෑණියන්ටත්,

හෙරණගත්කරණී 2024 ව්‍යාපෘතියේ සම්භන්ධීකාරක තුමිය වන සමන්මලී ගුරු මෑණියන්ටත්,

හෙරණගත්කරණී 2024 ව්‍යාපෘතියේ නිර්මාපක

සෙනවිරත්න මහලේකම්ගේ ගුරු පියාණන්ටත්

ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමියටත්

අප විද්‍යාලයේ විදුහල්පතිතුමියටත්

ආදරණීය අප්පච්චීටත්, අම්මාටත්, සහ

මල්ලීට

මගේ හද පිරි ස්තුතිය පිරිනමමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

මගේ නම පමෝ.

මම නිවාඩු දවසේ අවදිවෙලා, පටුවක් උඩ වාඩි වෙලා හිටියා.



ඔහොම ඉන්නේ, දෝණි ඔයාට වැඩ නැද්ද ? අම්මා මගෙන් අහනවා.



ඔන්න, අත්තම්මාත් ඒ ප්‍රශ්නෙම ඇහුවා.
අප්පච්චිත් ඒක ම ඇහුවා.



මල්ලි සෙල්ලම් කාමරේ ලොකු වැඩක් ක්ලේ ගුලියකින්. කටත් උල් කරගෙන. "මල්ලි බබා ඔයා මොකද කරන්නෙ?" මම ඇහුවා. "බබා වැඩක්" එයා හරිම ලොකුකමින් කිව්වා.



"වැඩක්" මේක, හැමෝ ම මගෙන් අහනවනේ. බලමු, තව කාටද වැඩ තියෙන්නේ කියලා.

ඇත්තටම මේ ලෝකෙ හැමෝට ම කරන්න වැඩක් තියනවද?

බලමු, ටිකක් එළියට ගිහින්...



මට මුලින් ම හමු වුණා මී මැස්සෙක්. "ඔයා මොකද කරන්නේ" මම එයාගෙන් ඇහුවා. "බබා, මම මී පැණි එකතු කරනවා. මල් පරාගනය කරනවා. එතකොට, ගස්වල ගෙඩිත් හැදෙනවා".

ඒක තමා මගේ වැඩේ කිව්ව, එයා පියඹලා ගියා.



ගැඩවිලෙක්, එයා මිදුලේ හිමින් බඩගාගෙන යනවා. "ඔයා වැඩක්ද? " "ඔව් මම පස් හාරල බුරුල් කරනවා". "මම කොලරොඩු පස් කාලා, පස සරු කරනවා". "මට හරියට වැඩ". එයත් ගියා.



ඔන්න, බුලට් බුරාගෙන, පාර පැත්තට දුවනවා. "බුලට් ඔයා කොහෙද යන්නේ ? " මම ඇහුවා. "අප්පෝ බබා, කව්ද අඳුරන්න්නේ නැති මනුස්සයෙක් අපේ පාරේ යනවා". "ඔයා ගෙට යන්න, මම එයා කවුද බලලා එන්නම්". "මමනේ ඔයාලාව ආරක්ෂා කරන්න ඕනෑ". "ඒක මගේ වැඩේනේ". ඔන්න, එයත් දිව්වා.



ඔන්න, කිටී පඳුරක් අස්සේ ඔළුව හරවා හරවා බලනවා. එයා පස්සයි වලිගෙයි නටවලා කුරුමානම් අල්ලනවා. "කිටී මොකද ඔයා කරන්නේ ?" මම ඇහුවා. "සද්ද කරන්න එපා බබා, මේ පඳුර අස්සේ විස සතෙක් ඉන්නවා, එයාව අල්ලගන්න හදන්නේ ". "මේවා මගේ වැඩනේ " කියාගෙන ම එයා පඳුර අස්සට පැන්නා.



මම වත්තට ගියා. අපේ කළු එළදෙන, වත්තේ තණකොළ කනවා. “ඔයා වැඩක්ද?” මම ඇහුවා. “මගේ වැඩ ටික නම් ඉවරයි බබා”. “උදේම කිරි බෝතල් දෙකක් දුන්නා”. “මම ඔයගේ සීයාට ගොමත් දුන්නා, එළවළු පාත්ත්තියට දාන්න”. “මම නම් උදෙන්ම වැඩ ඉවර කරනවා”. එයා කිව්වා.



බුග්... බුග්... ඇටි කුකුළා මල්පෝච්චි අස්සේ මොනවද කරනවා. "ඔයා වැඩක්ද?" මම ඇහුවා. "මම මේ මල් ගස්වල ඉන්න ගොළුබෙල්ලෝ අයින් කරනවා බබා". "ඔයා ඉස්කෝලේ යන නිසා, ඔයාට වෙලාවකුත් නෑනේ". "මේක ඉතින්, මගේ වැඩ්නේ ". එයා කිව්වා. ඒ වෙලාවේ තමයි, මට ඉස්කොලේ වැඩ මතක් වුණේ. හැමෝ'ට ම වැඩක් තියනවා.



මට තියන වැඩේ තමයි, හොඳට ඉගන ගන්න එක. ඉස්කොලේ වැඩ, ක්‍රීඩා, ව්‍යායාම කරලා, නාලා, සමබල ආහාර වේලක් අරගෙන, නිරෝගීව ඉඳීම. ගුණ දමුත් රකින්න ඕනෑ. ලෝකෙට ම වැඩක් වෙන්න, ජීවත් වෙන්නත් ඕනෑ. මට හමුවුණ, හැමෝ ම වගේ.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

9 786242 084831